**මහියංගණය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශිය සභවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිපිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------------

1.3.1 ශුද්ධ වත්කම් වල අඩුවීම
----------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.9,119,099 කින් ශුද්ධ වත්කම් අඩුවී තිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදි අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල කර්මාන්ත 16 ක් සඳහා ගෙවන ලද රු.2,400,000 ක අත්තිකාරම් මුදල් ණයහිමි ගිණුමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ගිණුමේ සහ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,400,000 බැගින් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ දම්බරාව සහබෝ පෙදෙස පිවිසුම් මාර්ගය කොන්ක්‍රිට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.487,500 ක් ණයගැතියන් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල රු.462,060 ක මුදලක් ලැබී තිබූ බැවින් 2013 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගේ ශේෂය හා සමුච්චිත අරමුදලේ ශේෂය රු.25,440 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) 2002 වර්ෂයේ හිඟ විගණන ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.18,356 ක මුදල ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුමට හර විය යුතු වුවද ණයහිමි ගිණුමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තුව රු.18,356 ක් වැඩියෙන් ද ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2012 වර්ෂය සඳහා ගෙවන ලද රු.45,024 ක් වූ විගණන ගාස්තු ප්‍රවර්තන වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ වියදම් රු.45,024 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් තුල ඇතුලත් රු.96,738 ක ලැබිය යුතු හිඟ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 16,677,396 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.16,242,449 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,516,721 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලයන්ට හා ප්‍රජාපාදක සංවිධාන වලට ද්‍රව්‍යාධාර ලබාදීම සඳහා අවස්ථා 10 කදී රු.169,950 ක මුදලක් වැයකර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | ආදායම් රැස්කරන, මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරනු ලබන නිලධාරීන් තිදෙනෙකු සේවක 180 රීතිය ඇප තබා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රය | |
| (i) | VII පරිච්ඡේදයේ 12:5:1 | සභා ලේකම් තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් 2013 වගන්තිය ජනවාරි සිට ජුනි මස දක්වා අවස්ථා 06 කදී රු.23,152 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ii) | Xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර සේවය හැර ගිය, විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය හා මිය ගිය සේවකයින් / නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.67,775 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.288,213 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,998,024 ක් විය. ඒ අනුව රු.2,286,237 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 1,532,873 | 1,562,548 | (29,675) | |
| බදු කුලී | 7,258,609 | 7,293,817 | (35,208) | |
| බලපත්‍ර ගාස්තු | 2,978,214 | 2,576,500 | 401,714 | |
| සේවා සඳහා ගාස්තු | 5,952,527 | 5,687,961 | 264,566 | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,561,471 | 1,215,329 | 346,142 | |
| වෙනත් ආදායම් | 850,831 | 803,436 | 47,395 | |
| ආදායම් ආධාර | 17,547,833 | 14,354,138 | 3,193,695 | |
| | | | | 4,188,629 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,144,598 | 21,279,251 | (1,865,347) | |
| ගමන් වියදම් | 435,940 | 471,803 | 35,863 | |
| සැපයුම් හා උපකරණ | 2,844,522 | 1,609,458 | (1,235,064) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,053,587 | 1,428,074 | 374,487 | |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 8,070,430 | 4,558,937 | (3,511,493) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | 597,968 | 597,968 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 2,420,494 | 1,549,214 | (871,280) | |
| | | | | (6,474,866) |
| අවාසිදායක විචලනය | | | | 2,286,237 |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **වරිපනම් බදු**

වර්ෂ පහකට වරක් වරිපනම් බදු සංශෝධනයක් සිදුකර ඒ අනුව බදු අයකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහාද 2001 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි.

2.3.2 **බලපත්‍ර ගාස්තු ගාස්තු**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 හා 60 ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර අයකර ගත යුතු වෙළඳ ආයතන හඳුනා ගැනීමට වර්ෂය ආරම්භයේ දී සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,587,570 |
| මුද්දර ගාස්තු | 1,905,688 |
| | 3,493,258 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **නිෂ්කාර්ය වත්කම්**

(අ) යුධ හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා ගෙන ගොස් තිබූ අංක 53-5096 දරන කැබ් රථය 2011 ඔක්තෝබර් 11 වැනි දින නැවත සභාව විසින් භාරගෙන ඇති අතර, එය සුදුසු පරිදි අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 12.5 KVA ධාරිතාවයෙන් යුත් Mack Power විදුලි ජනක යන්ත්‍රය අක්‍රියවීම නිසා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන ගබඩා අංගනයේ තිබුණි.

(ඇ) අංක: 37-7490 දරන ට්‍රැක්ටර් රථය ප්‍රයෝජනයට නොගෙන සභා අංගනයේ ගාල්කර තිබුණි.

3.2 **කසල බැහැර කිරීම**

දැනට සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන අතර සභා බල ප්‍රදේශය තුලින් රැස්කරනු ලබන කැලිකසල සභාව සතු මහියංගණයේ දොඩන්වත්ත ඉඩමට අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුනි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සභාවේ 2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම ප්‍රතිශතය | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| කුලී | 10,273,770 | 7,258,609 | 3,015,161 | 29.3 |
| බලපත්‍ර ගාස්තු | 2,210,000 | 2,978,214 | 768,214 | 34.7 |
| සේවා සඳහා ගාස්තු | 8,156,000 | 5,952,527 | 2,203,473 | 27.0 |
| ආදායම් ආධාර | 15,375,285 | 17,547,833 | 2,172,548 | 14.1 |

| පුනරාවර්තන වියදම් | | | | |
|---|---|---|---|---|
| ගමන් වියදම් | 815,000 | 435,940 | 379,060 | 46.5 |
| සැපයුම් හා උපකරණ | 2,530,000 | 2,844,522 | 314,522 | 12.4 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 4,110,000 | 1,053,587 | 3,056,413 | 74.3 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 5,272,000 | 8,070,430 | 2,798,430 | 53.0 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 564,840 | - | 564,840 | 100 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | - | 2,420,494 | 2,420,494 | 100 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය